**සබරගමුව පළාත් සභාව - 2013**

**------------------------------------**

සබරගමුව පළාත් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධි විධාන ප්‍රකාර, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

## 1.2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන්කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍යප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 <u>විගණකගේ වගකීම</u>

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබදව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI - 1000 - 1810)අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පළාත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.
මාගේ තත්ත්වාගණනයකළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ මතයයි.

1.4 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනයකරනු ලැබේ.

02. <u>මූල්‍ය ප්‍රකාශන</u>

2.1 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍යප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට සබරගමුව පළාත් සභාවේමූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වයහා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

2.2.1 <u>පළාත් සභා අරමුදල</u>

සමාලෝචිත වර්ෂයේ පළාත් සභා අරමුදල් ගිණුම 2014 මාර්තු 31 දින විගණනයට ඉදිරිපත් කරන ලදී.

2.2.2 අනෙකුත් ගිණුම්

සමාලෝචිත වර්ෂයට අදාලව 2014ජූනි 30 දිනට පළාත් සභාවේ අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| | | මුළු ගිණුම් | ඉදිරිපත් කළ ගිණුම්සංඛ්‍යාව | ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | විසර්ජන ගිණුම් | 28 | 28 | - |
| (ii) | ආදායම් ගිණුම් | 01 | - | 01 |
| (iii) | පළාත් රාජ්‍ය නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් | 25 | 23 | 02 |
| (iv) | වාණිජ අත්තිකාරම් ගිණුම් | 05 | 03 | 02 |
| (v) | අරමුදල් ගිණුම් | 03 | 02 | 01 |
| (vi) | ප්‍රඥප්ති ගිණුම් | 03 | 03 | - |
| (vii) | මන්ත්‍රීවරුන්ට අත්තිකාරම් ගිණුම් | 02 | 02 | - |
| | | 67 | 61 | 06 |

2.2.3 ගණකාධිකරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ 2013 දෙසැම්බර් 31 දිනට කෙටිකාලීන ආයෝජන යටතේ දක්වා තිබූ රු. 3,371,763,492 ක ශේෂය තුල ඇතුළත්ව තිබූ එකතුව රු. 1,500,000,000 ක් වූ ස්ථාවර තැන්පතු 02 ක් සත්‍ය වශයෙන් විවෘතකර තිබුණේ 2014 ජනවාරි 02 දින වූයෙන් 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මුදල් ශේෂය රු. 1,500,000,000 ක් අඩුවෙන් ද ආයෝජන ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද දක්වා තිබුණි.

(ආ) සබරගමුව පළාත් මූල්‍ය රීති 309 අනුව මුදල් වර්ෂය අවසානයේදී හැකි පමණ ඉක්මනින් දෙසැම්බර් 31 වනදා වන විට පළාත් භාණ්ඩාගාර පොත් වලින් අනාවරණය කෙරෙන පරිදි පළාත් සභා අරමුදලට එක එල්ලේම සම්බන්ධ වත්කම් හා හර ශේෂ සහ බැරකම් හා බැර ශේෂ පිළිබඳ ප්‍රකාශයක් පිළියෙල කර විගණකාධිපති වෙත විගණනය කිරීමට ඉදිරිපත් කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ඉදිරිපත්කර තිබුණු මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ පළාත් සභා අරමුදලින් ජනිතවූ රු.594,654,941ක් වූ වත්කම් ඇතුළත්කර නොතිබුණි.

(ඇ) සබරගමුව පළාත් සභාවේ විවිධ ප්‍රඥප්ති මගින් පිහිටුවා ඇති අරමුදල් 04 ක් හා අධිකාරී 03 කට අදාල මූල්‍ය තත්ත්වයන් සහ මූල්‍ය ප්‍රතිඵල පළාත් සභා අරමුදල පිළිබඳව මූල්‍ය ප්‍රකාශන තුල ඇතුළත්කර නොමැති බැවින් ඉදිරිපත්කර ඇති මූල්‍ය ප්‍රකාශන මගින් සමස්ථ සබරගමුව පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය හා මූල්‍ය ප්‍රතිඵල නිරූපණය නොකෙරේ.

2.2.4 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

ගිණුම් විෂයයන් 08 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු. 316,788,589 ක් වූ අතර, උපයෝගි ලේඛන/වාර්තා අනුව එම ගිණුම් ශේෂයන්ගේ එකතුවරු.346,881,278 ක් වුයෙන් රු.34,728,310ක නොසැසඳුනු වෙනස්කම් නිරීක්ෂණය විය.

2.2.5 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

අවුරුදු 01ක කාලයක් ඉක්මවා තිබු ලැබිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.35,334,392 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 2,366,218 ක් විය.

2.2.6 <u>විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **<u>පිළිතුරු නොලත් විගණන විමසුම්</u>**

2013 දෙසැම්බර් 31 දින වන විට විගණන විමසුම් 54 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබු අතර,එකී විමසුම්වලට භාජනය වූ ගණනය කළ හැකි ගණුදෙනුවල වටිනාකම රු. 255,032,913 ක් විය.

(ආ) **<u>තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම</u>**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ආයතන 07කට අදාලඑකතුවරු.25,898,268 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි වූ අතර, ඇහැලියගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාලයට2013 වර්ෂයට අදාලව ලැබී තිබූපැමිණිලි සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග සහ මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් විසින් 2013 වර්ෂයේ දී ආයතන 06 කට එරෙහිව පවරා තිබු නඩු වාර්තා ඇතුළත් ලිපිගොනුවිගණනය සඳහා ඉදිරිපත් නොවුණි.

2.3 <u>නීතිරීති, රෙගුලාසිහාකළමනාකරණතීරණවලටඅනුකූලනොවීම</u>

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2009 සැප්තැම්බර් 15 දිනැති දේශිය ආදායම් නියෝජ්‍ය කොමසාරිස් (වැට්) ගේ ලිපිය | නැවත දන්වන තුරුවැට් බදු ගෙවීම අත්හිටුවා ඇති කොන්ත්‍රාත්කරුවෙකු වෙත අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු 02 ක් විසින් අවස්ථා 10 ක දී එකතුවරු. 1,160,708 ක් වූ වැට් බදු ගෙවීමට කටයුතු කර තිබුණි. |
| (ආ) | අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2011 මැයි 11 දිනැති අංක ED/01/12/10/06/01 හා 2011/18 දරණ චක්‍රලේඛයේ හා 2010 මැයි 31 දිනැති 2010/21 දරණ චක්‍රලේඛයේ 3:1 හා 13:1 වගන්ති | පන්තියක් සඳහා ඇතුළත් කරගත යුතු ළමුන් සංඛ්‍යාව 42 ක් වුවද, මාවනැල්ල අධ්‍යාපන කලාපයේ පාසලක 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා පංති 15ක සිටිය යුතු ළමුන් ප්‍රමාණය ඉක්මවා ළමුන් 273 ක් වැඩිපුර ඇතුළත් කරගෙන තිබුණි. |
| (ඇ) | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයේ 1998 අගෝස්තු 26 දිනැති ආපන ශාලා ආදායම් හා වියදම් වලට අදාල පොදු චක්‍රලේඛ අංක 02/86/98 | |

| | |
|---|---|
| (i) 2.1වගන්තිය | සුභසාධක සමිති මෙහෙයවීමෙන් ටෙන්ඩර් කැඳවා ආපන ශාලා පවත්වා ගෙන යාමෙන් ලැබෙන මාසික කුලිය ඇතුළු සියළු ආදායම් සුභසාධක සමිතිය නමින් පිළිගත් බැංකුවක වෙනම ගිණුමක් ආරම්භ කොට එයට බැර කල යුතු වුවත්,බලංගොඩ මූලික රෝහලේ ආපන ශාලාවෙන් 2012 හා 2013 වර්ෂවලදී ලද කුලී ආදායමෙන් රු.686,380ක් වූ කුලී ආදායම බැංකු ගිණුමේ තැන්පත් නොකර වියදම් පියවා ගැනීම සඳහා භාවිතා කර තිබුණි. |
| (ii) 2.4වගන්තිය | ආපන ශාලා ආදායමින් මුදල් වියදම් කිරීමට ප්‍රථම යෝජිත වැඩසටහන් සකස්කර නියමිත බලධාරීන්ගේ පූර්ව අනුමැතිය ලබාගතයුතු වුවත්, ඉහත රෝහලේ ආපන ශාලාව නවීකරණය සඳහා දරන ලද එකතුව රු. 425,517ක් වූ වියදම් සම්බන්ධයෙන් අදාළ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඈ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ යොමුව 8:12 හි 05 වන ඡේදය | අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2012 වර්ෂයේ දෙසැම්බර් මස සිට 2013 ජූනි දක්වා අවස්ථා 65 ක දීගෙවූ එකතුව රු.9,599,105 ක් වූ වැට් බදු සම්බන්ධයෙන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට අදාල ආකෘතිය මත දැනුම් දීමට පියවර ගෙන නොතිබුණි. |
| (ඉ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේසබරගමුව පළාත් සභාවේ මූල්‍ය රීති සංග්‍රහය | |
| (i) මූල්‍ය රීති 118 | ආයතන 02ක් වෙත ලැබී තිබූ එකතුව රු.757,905 ක මුදලක් බැංකු ගත කිරිමෙන් තොරව දින 02 -30 දක්වා කාල පරාසයක් අත රඳවාගෙන තිබුණි. |
| (ii) මූල්‍ය රීති 261.2.2 | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා කලාප අධ්‍යාපන කාර්යාල 02 ක් විසින් සමාලෝචිත වර්ෂය තුළ ලබා දී තිබූ එකතුව 1,770,996 ක් වූ අත්තිකාරම් දින 16 සිට දින 150 දක්වා ප්‍රමාද වී පියවා තිබූ අතර, රත්නපුර දිස්ත්‍රික්කයේ කළාප අධ්‍යාපන කාර්යාල 02 ක් විසින් කලින් දෙන ලද අතුරු අග්‍රිමයන් පියවා නොමැති අවස්ථා 27 කදි එකතුව රු.1,519,514 ක් වූ අග්‍රිම නැවත නිකුත්කර තිබුණි. |

2.4 <u>ප්‍රමාණවත් අධිකාරී බලයක් තහවුරු නොවූ ගණුදෙනු</u>

මුදල් කොමිෂන් සභා ලේකම්ගේ 2013 මාර්තු 01 දිනැති අංක FC/PR&P/GL/2013 දරණ ලිපියෙහි 04 ඡේදය ප්‍රකාරව පුහුණු වැඩසටහන් සඳහා එම විෂය සම්බන්ධයෙන් වගකීම දරන අමාත්‍යාංශයේ හෝ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් රාජකාරී දිනවල සම්පත් දායකයින් ලෙස සම්බන්ධ කරගන්නේ නම් සම්පත් දායක දීමනා ලබා ගත නොහැකි වුවද, ඊට පටහැනිව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හා රත්නපුර දිස්ත්‍රික්කයේ කළාප අධ්‍යාපන කාර්යාල 02 ක නිලධාරීන් 44 කු වෙත සමාලෝචිත වර්ෂය තුල දී සම්පත්දායක දීමනා ලෙස එකතුව රු. 203,400 ක මුදලක් ගෙවීම්කර තිබුණි.

03 <u>ආදායම් කළමනාකරණය</u>

3.1 <u>**පසු ගිය වර්ෂ 05 ක ආදායමේ උපනතිය**</u>

පසුගිය වර්ෂ 05 තුළ දී පළාත් සභාව විසින් එකතු කරන ලද බදු ආදායම සහ බදු නොවනආදායම පහත පරිදි වේ.

| වර්ෂය | බදු ආදායම | බදු නොවන ආදායම |
|---|---|---|
| | රු. | රු. |
| 2008 | 1,012,846,946 | 251,306,994 |
| 2009 | 1,146,644,488 | 271,623,594 |
| 2010 | 1,382,363,156 | 321,209,919 |
| 2011 | 1,943,637,444 | 416,079,145 |
| 2012 | 2,007,749,583 | 496,404,402 |

3.2 <u>හිඟ ආදායම</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සබරගමුව පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08ක් විසින් විවිධ ආයතන සහ පුද්ගලයන් වෙත බදු දී තිබූ ඉඩම් සහ ගොඩනැගිලි වෙනුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු. 23,962,767ක් වූ දිගු කාලීන බදු සහ එකතුව රු. 2,236,725ක් වූ වාර්ෂික බදු 2014 සැප්තැම්බර් මස වන විට ද හිඟව පැවති අතර ඒ සම්බන්ධයෙන් 1996 අගෝස්තු 01 දිනැති අංක 96/05 දරන ඉඩම් කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 07 වගන්තිය ප්‍රකාරව අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.තව ද 2013 දෙසැම්බර් 31 දිනට පැවතිබුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලට අදාල වූ එකතුව රු.165,000 ක් වූ ජල බදු වටිනාකම ද , ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ට අදාල වූ එකතුව රු.292,932 ක් වූ වාර්ෂික ඉඩම් බලපත්‍ර ගාස්තු ද 2014 ඔක්තෝබර් වන විටද අයවිය යුතුව පැවතුණි.

(ආ) ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පුද්ගලික ජල විදුලි ව්‍යාපෘතියක ජලනල එලීමවෙනුවෙන් වාර්ෂික බදු මුදල්අයකිරීමේ දී ප්‍රධාන තක්සේරුකරු විසින් කරනු ලැබූ තක්සේරු වටිනාකම අනුව බදු ගණනය නොකිරීම නිසා 2009 වසරේ සිට 2013 වසර දක්වා බදු මුදල් ලෙසරු. 209,980ක් අඩුවෙන් අයකර තිබුණි.

(ඇ) පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් එකතු කරන ලද ආදායම් සංකේත 04කට අදාළව 2012 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම එකතුව රු. 34,871,991ක් වූ අතර, ඉන් 2013 වර්ෂයේ දීරු. 8,421,456 ක් පමණක් එකතු කර තිබුණි.එක් එක් ආදායම් සංකේතය අනුව හිඟ ආදායම් එකතු කිරීමේ ප්‍රගතිය සියයට 0.8 සිට සියයට 27 දක්වා වූ පරාසයක අඩු ප්‍රතිශතයක් බවට නිරීක්ෂණය විය.

3.3 සබරගමුව පළාතේ පළාත් පාලන ආයතන 21කට අදාලව සමාලෝචිත වර්ෂයේදී ප්‍රධාන ලේකම් වෙත ලැබී තිබූ උසාවි දඩ මුදල් වලින් එකතුව රු.20,921,374 ක් 2013 දෙසැම්බර් 31 දින වන විට අදාළ පළාත් පාලන ආයතන වලට ගෙවිය යුතුව පැවතුණි.

04 <u>මූල්‍යසමාලෝචනය</u>

4.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු.1,916,626,676ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තයරු. 578,643,467ක් විය.

4.2 <u>ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි</u>

පළාත් සභාවේ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු 15 කට එරෙහිව බාහිර පාර්ශවයන් විසින් පනවා තිබූ නෛතික සිද්ධි 139 ක් සහඅමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු02 ක් විසින් බාහිර පාර්ශවයන් වෙත පනවා තිබූ නෛතික සිද්ධි 03 ක් 2013 දෙසැම්බර් වන විට විභාග වෙමින් පැවැතුණි.

4.3 <u>වියදම්වල අසාමාන්‍ය වැඩිවීම</u>

සමාලෝචිත වර්ෂයේ තත්‍ය වියදම 2012 වර්ෂයේ තත්‍ය වියදම සමඟ සංසන්දනය කිරීමේදී සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 03 කට අදාල තත්‍ය වියදම 2012 වර්ෂයේ වියදමට වඩා සියයට 56 සිට සියයට 214 දක්වා වූ පරාසයකින් අසාමාන්‍ය ලෙස වැඩිවී තිබුණි.

05 <u>අධිකාරීගිණුම්</u>

(අ) <u>කර්මාන්ත සංවර්ධන අධිකාරිය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2007 වර්ෂයේ සිට 2013 අප්‍රේල් 30 දින දක්වා ආයතන 16 ක් සඳහා විකුණන ලද එකතුවරු. 862,576 ක නිමි තොග,2014 ඔක්තෝබර් 15 දින තෙක් වැඩ බිමෙන් ඉවත් කර ගෙන නොතිබුණි. එම වටිනාකම තුල ඇතුලත් සියළු විකුණුම්, ණයට විකුණුම් වන බැවින් එම ණයට විකුණුම් බිල්පත් අවලංගු කර තොගයට ගැනීමට කටයුතු කල යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ii) කර්මාන්ත සංවර්ධන අධිකාරියවෙරළුප අත්කම් මැදුරේ බදු දී තිබූ වෙළඳ කුටි 04 න් වෙළඳ කුටි 02 ක් සඳහා 2013 දෙසැම්බර් 31 දිනට හිඟබදු කුලී ආදායම වූ එකතුව රු. 211,000 ක් විගණිත දිනය වූ 2014 ඔක්තෝබර් 15 දින තෙක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේආයතන සංග්‍රහයේ viii පරිච්ඡේදයේ 4.1 ඡේදය ප්‍රකාරව ක්ෂේත්‍ර රාජකාරි වල නිරත නිලධාරීන් හට අතිකාල දීමනා ලබා ගැනීමට හිමිකමක් නොමැති වුවත්, ඊටපටහැනිව කර්මාන්ත සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරී හට සමාලෝචිත වර්ෂය තුල අතිකාල දීමනා ලෙස රු. 76,267 ක් ගෙවා තිබූ අතර, නිවාඩු දින වැටුප් ලෙස එකතුව රු.20,340 ක්ගෙවීම් කර තිබුණි.

(ආ) <u>සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අධිකාරියේ2013 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 46,654,421 ක් වූ මුළු ණයගැතියන්ගෙන් සියයට 62.4 ක් වර්ෂයකට අධික පැරණි ශේෂයන්ගෙන් සමන්විත වන අතර එකතුව රු. 9,827,378 ක ණයගැති ශේෂ අක්‍රීය ණයශේෂ ලෙස දිගින් දිගටම ඉදිරියට ගෙන ගොස් තිබුණි. ඒ තුළ රු. 2,334,254 ක් වූ හඳුනා නොගත් ණය ගැති ශේෂයක්ද ඇතුළත්වීතිබුණි.

(ii) 2013 මාර්තු 04 දිනැති අංක DeCMA/AD/05/ පුවත්පත් දැන්වීම් දරන ලිපිය මඟින් දිනපතා පුවත්පතක ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වෙත සුභ පැතීමේ අතිරේකයේ අධිකාරිය වෙනුවෙන්ද වර්ණ සම්පූර්ණ පිටුවක් වෙන්කර දෙන ලෙස ඉල්ලීම්කර රු. 232,960 ක මුදලක් ගෙවා තිබූ නමුත් එම පුවත්පත් අතිරේකයෙහි ආයතනය නමින් කිසිදු දැන්විමක් පළකර නොතිබුණි.

(iii) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2009 අප්‍රේල් 29 දිනැති අංක PED 58 දරණචක්‍රලේඛයට අනුවනියමිත වර්ගීකරණයක් ලබා නොගෙන 2011 ඔක්තෝබර් 19 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී 2011 මැයි 01 සිට ක්‍රියාත්මකවන පරිදි සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය "C" ශ්‍රේණිය යටතේ වර්ගකර අදාල තනතුරු සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් "C" ශ්‍රේණියට අදාලකර තිබුණු දීමනා ලබාගෙන තිබුණි.

(iv) අධිකාරියේ ලාභදායීත්ව අනුපාතයන් සැලකීමේදී දළ ලාභ අනුපාතය 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේදී සැලකිය යුතු විචලනයක් නොතිබියදී ශුද්ධ ලාභ අනුපාතය සියයට 13.5 සිට සියයට 2.23ක සෘණ අගයක් දක්වා අඩුවීමක් පෙන්නුම් කෙරෙන අතර පරිපාලන වියදම් අනුපාතය සියයට 32 සිට සියයට 63 දක්වා දෙගුණයකින් පමණ වැඩිවී ඇත. මේ අනුව 2012 වර්ෂයේදී රු.10,694,853 ක ලාභයක් වාර්තාකර තිබියදී 2013 වර්ෂයේදී රු.1,734,891 ක අලාභයක් වාර්තා වීමට ප්‍රධාන හේතුව ලෙස අධිකාරියේ පරිපාලන වියදම් ඉහළයාමත් ඊට අනුරූපීව ආදායම ඉහළ නොයෑමත් බව නිරීක්ෂණය කෙරේ.

(v) 2011 වර්ෂයේදී නිල වශයෙන් සිය රාජකාරි කටයුතු ආරම්භ කර ඇතිඅධිකාරිය,විගණන විමසුම් මගින් පෙන්වා දුන්නද 2014 ජුනි 13 දින දක්වාම පාරිතෝෂිත ගෙවීම් වෙනුවෙන් අරමුදලක් පිහිටුවා නොතිබුණි.

06 මෙහෙයුම් සමාලෝචනය

6.1 කාර්ය සාධනය

පළාත් සභාවේ සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදමට අදාල ශුද්ධ ප්‍රතිපාදනය හා තත්‍ය වියදම සලකා බැලීමේදී අමාත්‍යාංශ 04 ක අග්‍රිම නොලැබීම හේතුවෙන් එකතුව රු. 691,477,416ක ප්‍රාග්ධන ප්‍රතිපාදන ඉතිරි වී තිබූ අතර, එම තත්ත්වය පළාතේ සංවර්ධන කටයුතු කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකි බවට නිරීක්ෂණය කෙරේ.තවද, 2013 දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ ස්ථාවර තැන්පතු ශේෂය රු. 3,371,763,492 ක් වූ අතර, වර්ෂ කිහිපයක සිට පැවත එන එම අරමුදල් උපයෝගී කරගෙන ඉහතින් දැක්වූ අග්‍රිම නොලැබීම මත ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ සංවර්ධන කටයුතු ඉටු කිරීමට ඇති ඉඩ ප්‍රස්තා සොයා බලා ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

6.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණකාධිපති විසින් විවිධ අවස්ථා වලදී පනවන ලද අධිභාර සහතික සඳහා වන මුදල් අයකරවා ගැනීම සම්බන්ධයෙන් මහා නගර සභා ආඥා පනතේ 252අධිකාරියේ 226 (5),(6)වගන්ති යටතේද, නගරසභා ආඥා පනතේ 255 අධිකාරියේ183 (5) වගන්තිය යටතේ සහ 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 172 (8),(9) හා (10) වගන්ති යටතේ සඳහන් පරිදි කටයුතු නොකිරීම හේතුවෙන්1971 වර්ෂයේ සිට විගණකාධිපති විසින් විවිධ අවස්ථාවන්හිදී නිකුත් කළ අධිභාර සහතිකවලින් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට අධිභාර සහතික 38 ක් යටතේ එකතුව රු. 2,270,627 ක ප්‍රමාණයක් අයවිය යුතුව පැවතුණි.

6.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉඩම්, පළාත් වාරි මාර්ග, කෘෂිකර්ම, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍යසහධීවර කටයුතු අමාත්‍යාංශයවිසින්රු.322,655ක් වැයකර ඉදිකර තිබූ පොල්බැම්ම වාරි අමුණ ඉදිකිරීමේ කර්මාන්තය විගණනය විසින් දෙවන වරටද පරික්ෂා කරන ලද 2014 සැප්තැම්බර් 17 දින වන විටද ඉදිකර වසර දෙකක් පමණ ඉක්ම ගොස් තිබුණද , කර්මාන්තය මගින් එකදු කන්නයකට හෝ ජලය සැපයීම සිදුකර නොතිබුණි.

(ආ) පළාත් මාර්ග සංවර්ධනග්‍රාමීය යටිතල පහසුකම්, සංචාරක සහ ක්‍රීඩාහා යෞවන කටයුතු අමාත්‍යාංශයට 2010 වර්ෂයේ දීකොන්ත්‍රාත්කාර ආයතනයක් විසින් ඉදිරිපත්කර තිබූ අංක NN 12/10 දරන හා 2010 මැයි 10 දිනැතිරු.981,000ක වටිනාකමැති කාර්ය සාධන ඇපකරය ව්‍යාජ එකක් බවට විගණනයේදී තහවුරු වූ අතර, මෙම වංචනික ක්‍රියාව සම්බන්ධයෙන් රත්නපුර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති හා විශේෂ අපරාධ විමර්ශන අංශය වෙත පැමිණිලි කර තිබුණද, 2014 ඔක්තෝබර්මස දක්වා එම පරීක්ෂණ අවසන් වි නොතිබුණු අතර මේ පිළිබඳව අමාත්‍යාංශයේ පසු විපරම් කටයුතු මන්දගාමී ස්වරූපයක පැවතුණි.

(ඇ) රු.1,929,714ක් පිරිවැයැති ලීටර් 180 තාර බැරල් 112 ක් දෙහිඕවිට විධායක ඉංජිනේරු කාර්යාලයෙහි අනාරක්ෂිතව ගබඩාකිරීම හේතුවෙන් ඒවා විනාශයට පත්වෙමින් පැවතුණු අතර ප්‍රමාණවත් ගබඩා ඉඩ පහසුකම් නොමැතිවීම නිසා මෙම තත්ත්වය ඇති වී ඇති බවට නිරීක්ෂණය කෙරේ.

(ඇ) 2006 වර්ෂයේදී සෞඛ්‍ය සේවා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ඌරුවලබෙහෙත් ශාලාව සඳහා ඉදි කරන ලද ගොඩනැගිල්ල 2012 ජූලි මස විගණිත අවස්ථාව වන විට ප්‍රයෝජනයට නොගෙන වල් බිහිවෙමින් පැවතුන අතර, එයට කිලෝ මීටර් 2 ක් පමණ දුරින් නව ගොඩනැගිල්ලක් ඉදිකරගෙන බෙහෙත් ශාලාවපවත්වාගෙන යන බව නිරීක්ෂණය විය.

(ඉ) මාවනැල්ල අධ්‍යාපන කලාපයේ පාසලකපුස්තකාලයවේයන් විසින් විනාශ කරමින් පැවති අතරඅළුත්වැඩියා කිරීමේ අවශ්‍යතාවයඅදාල අමාත්‍යාංශය වෙත දැනුම් දී තිබුණද අළුත්වැඩියාකටයුතු සිදුකර ආරක්ෂා කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. වේයන් විසින් විනාශ කරන ලද පුස්තකාලපොත් 106 ක් 2011 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී විනාශ කර තිබූ අතරවිගණිත අවස්ථාව වූ 2014 ජනවාරි 28 දින වන විටත් පොත් රාක්ක 03 ක් විනාශ වෙමින් පැවතුණි.

(ඊ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 11 වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 21:1 උප වගන්තිය ප්‍රකාරව, විධිමත් විනය පරීක්ෂණ විනිශ්චය සභාවක් ලෙස පත්කරණු ලැබූ නිලධාරියෙකු අප්‍රමාදව හෝ විනය බලධාරියා විසින් නියම කරනු කාල සීමාවක් තුළ හෝ අදාල විධිමත් විනය පරික්ෂණ පවත්වා නොපමාව පරීක්ෂණ වාර්තාව විනය බලධාරියා වෙත ඉදිරිපත් කල යුතු වුවද පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කරන ලද විවිධ විනය කටයුතු පිළිබඳ ලිපිගොනු 34 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබූ අතර, විගණිත දිනය වූ 2014 මැයි 12 වන විටත් වර්ෂ 01 ක සිට වර්ෂ 03 ක් දක්වා විනය කටයුතු සිදුකිරීමේ ප්‍රමාදයන් පැවතුණි.

(උ) පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් පළාත් පාලන ආයතන සභිකයින්ට ලබාදෙනු ලබන සභික අත්තිකාරම් යටතේ වාරික අයකර ගැනීමේදී යම් සභිකයෙකුට මාසික දීමනා හිමි නොවූ අවස්ථාවලදී අදාල වාරිකය ඔහුගෙන් අයකර පළාත් පාලන කොමසාරිස් මඟින් ප්‍රධාන අමාත්‍යාංශයට ප්‍රේෂණය කිරීම සභාවේ වගකීමක් වුවද, රත්නපුර ප්‍රාදේශීය සභාවේ සභිකයින් 15 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් හිඟහිට තිබූ රු. 82,000 ක මුදල අයකරවා ගැනීම සඳහා 2014 ඔක්තෝබර් 13 දින වනවිට ද කටයුතු කර නොතිබුණි. තවද, මෙම අත්තිකාරම් ලබා දීමේදී, ගිවිසුමෙහි 02 වගන්තිය අනුව අදාල ලියවිලිවල මුල් පිටපත් පළාත් පාලන කොමසාරිස් හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා වෙත 2012 අගෝස්තු 05 දිනට පෙර ඉදිරිපත් කල යුතු වුවත්, පළාත් පාලන ආයතන 18 ක් නියෝජනය කරන මහජන නියෝජිතයන් 133 දෙනෙකු ලබා ගත් එකතුව රු. 19,890,000 ක ණය මුදල සඳහා වර්ෂ 1½ ක කාලයක් ගත වුවද, ගිවිසුමේ උක්ත වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඌ) බලංගොඩ අධ්‍යාපන කලාපයේ පාසලක වායු සමීකරණය කළ පරිගණක මධ්‍යස්ථානයක් ස්ථාපිත කර තිබුණද , 2010 වර්ෂයේ සිට 2013 නොවැම්බර් දක්වාම එය කිසිදු භාවිතයකින් තොරව වසා තිබුණි. බඩු වට්ටෝරු පොත අනුව පරිගණක 13 ක් ලැබී තිබුණද, 2010 වර්ෂයේදී ඉන් පරිගණක 02 ක් අස්ථාන ගතවී තිබූ අතර , තවත් පරිගණක 07 ක වටිනා උපාංග ගලවා ගෙනගොස් තිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකර ඇති විමර්ශනයේ වාර්තාව අනුව මෙම පාඩු සම්බන්ධයෙන් එවකට සිටි විදුහල්පතිවරයා වගකිව යුතු බව වාර්තා කර තිබුණද 2014 ඔක්තෝබර් 16 දින දක්වා පාඩුවේ වටිනාකම තීරණය කර නොතිබුණු අතර අදාල අය කිරීම් ද සිදුකර නොතිබුණි.

(එ) මධ්‍යම රජයේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින්සබරගමුව පළාත තුල සිටින වතු ප්‍රජාවගේ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම සහ සුවදිවිමධ්‍යස්ථානකටයුතුදියුණුකිරීම සඳහා වෙන් කරනලද ප්‍රතිපාදනවලින්රු. 3,185,000 ක මුදලක් රත්නපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකාර්යාලය වෙත ලබා දී තිබුණද,එම වැඩසටහන් ක්‍රියාත්මක කිරිමේ අකාර්යක්ෂමතාවය හේතුවෙන් එකතුව රු. 1,110,818 ක මුදලක් වියදම් නොකර නැවත සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ප්‍රේෂණය කර තිබුණි.

(ඒ) රත්නපුර දිස්ත්‍රික්කයේ රක්වාන දිසා රෝහලේ ජීව වෛද්‍ය උපකරණ වර්ග 12 ක ඒකක 41 ක් ද, කාර්යාලීය උපකරණ වර්ග 06 ක ඒකක 72 ක් ද, රෝහල් උපකරණ වර්ග 15 ක ඒකක 404 ක් ද වශයෙන් ඌණතාවයන් නිරීක්ෂණය කෙරේ. තවද කෑගල්ල දිස්ත්‍රික්කයේ මහපල්ලේගම ප්‍රාදේශීය රෝහලේ නේවාසික රෝගී ප්‍රතිකාර සේවාවන් සඳහා අත්‍යවශ්‍ය උපකරණ වර්ග 12ක ඌණතාවයක් පැවතුණු අතරසූතිකාගාරයේ පැවති ඉමර්ජන්සි ලැම්ප් එක ක්‍රියා විරහිතව පැවතුණි. තවද, වහලයේ සිවිලිම කැඩී තිබූ ස්ථානවලින් වැසි අවස්ථා වලදී සූතිකාගාරය තෙමෙන බැවිද අනාවරණය විය.

(ඔ) ඇහැලියගොඩ දිසා රෝහලේආරක්ෂක සේවා සැපයුම සම්බන්ධ ගිවිසුමේ කොන්දේසි අංක 06 අනුව, ප්‍රධාන ආරක්ෂක නිලධාරීන් දෙදෙනෙකු යෙදවිය යුතු වුවත්, එක් අයෙකු පමණක් යොදවා රු.221,400ක මුදලක් ද, ගිවිසුමේ කොන්දේසි අංක 06 අනුව ප්‍රධාන ආරක්ෂක නිලධාරියෙකුට දිනකට රු. 615 බැගින් ද ආරක්ෂක භටයෙකු සඳහා දිනකට රු.580 බැගින් ද වැටුප් වශයෙන් ගෙවිය යුතු වුවත් පිළිවෙලින් එම නිලධාරීන්ට රු. 450 ක් හා රු. 400 ක් බැගින් ගෙවා තිබීමෙන් රු. 454,425 ක මුදලක් ද වශයෙන් එකතුව රු. 675,825 ක මුදලක් ගිවිසුම්ගත කොන්දේසි කඩකරමින් කොන්ත්‍රාත්කරු විසින් උපයා ගැනීමට කටයුතු කර තිබුණි.

(ඕ) ඇහැලියගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ ඖෂධ තොග භෞතික පරීක්ෂාවේ දී ඖෂධ වර්ග 07 ක් සම්බන්ධයෙන් ඒකක 500 – 20000 දක්වා පරාසයක විචලතාවයන් නිරීක්ෂණය වූ අතර ඖෂධ වර්ග 03 ක ඒකක 30,000 ක් වර්ෂ 02 සිට වර්ෂ 07 දක්වා කාල පරාසයකින් කල් ඉකුත්වී තිබුණු අතර, රත්නපුර දිස්ත්‍රික්කයේ රෝහල් 02 ක ඖෂධ වර්ග 23 ක් මාස 02 සිට අවුරුදු 01 දක්වා වූ කාල පරිච්ඡේදයක සිට හිඟව පැවතුණි.

(ක) 1980 අංක 26 දරන ආහාර පනතේ 16 වගන්තිය යටතේ විශ්ලේෂණය සඳහා මාසිකව ආහාර සාම්පල් 02 ක් පමණ රජයේ රස පරීක්ෂක කාර්යාලය වෙත යැවීමට සැලසුම් කර තිබුණ ද, 2013 ඔක්තෝබර් මාසය වන විට ඇහැලියගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය විසින් මහජන සෞඛ්‍ය පරීක්ෂක ප්‍රදේශ 06 ක් වෙනුවෙන් ආහාර සාම්පල් 15 ක් පමණක් විශ්ලේෂණය සඳහා යොමු කර තිබුණු අතර, සැලසුම් කළ පරිදි එම කාර්යය ඉටු කිරීමට අපොහොසත් වී තිබුණි.

(ග) ඇහැලියගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලයේමහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාශ 03 කට අදාල ජල ව්‍යාපෘති 04 ක ජල සාම්පල් පරීක්ෂා කර තිබුණු අතර, එම සාම්පල් වල බැක්ටීරියා අඩංගු බව වාර්තා කර තිබුණ ද , ඊට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු අතර, ඒ සම්බන්ධ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

(ච) කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලැබී තිබුණු නමුත් නිශ්චිතව ලැබුණු දිනය නොදන්නා දීමනා පත්‍ර 37ක් හා ග්‍රාම නිලධාරී කොට්ඨාශ 11ක වැඩ අවසන් කල ඉඩම් බලපත්‍ර

222 ක් 2014 සැප්තැම්බර් 24දින වන විටත් අදාල දීමනා/බලපත්‍රලාභීන් වෙත බෙදා දී නොතිබුණි .

(ඡ) 2001 වර්ෂයේ දී ඹපනායක ප්‍රාදේශීය ලේකම්වරයා විසින් අත්පත් කරගත් රු. 592,375 ක තක්සේරු වටිනාකමක් සහිත ඉඩම් කොටස් 26ක් වෙනුවෙන් 2014සැප්තැම්බර් 24 දක්වාම වන්දි මුදල් ගෙවා නොතිබුණි.

(න) රත්නපුර මහ නගර සභාවේ සේවය කළ කාලය තුළ දී විෂමාචාර සිද්ධියක් සම්බන්ධයෙන් 2011 මාර්තු 22 සිට 2011 නොවැම්බර් 29 දින දක්වා වැඩ තහනමකට ලක්වී සිටි වර්තමානයේ යටියන්තොට ප්‍රාදේශීය සභාවේ සේවය කරන කාර්මික නිලධාරීවරයෙකු විධිමත් විනය පරීක්ෂණයකට යටත්ව 2011 නොවැම්බර් 30 දින සිට නැවත සේවයේ පිහිටුවා තිබිණි. කෙසේ වෙතත් විධිමත් විනය පරීක්ෂණයක් ක්‍රියාත්මක නොකොට පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක PPSC/ES/07/F1/04/01/2 හා 2013 ජූලි 03 දිනැති ලිපියට අනුව මෙම නිලධාරියා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (සිවිල්) 01 පන්තියට උසස්කර තිබුණි.

(ත) 2012වර්ෂයේදී ප්‍රධාන අමාත්‍යාංශය විසින්පාසල් වෙත බෙදා දීම සඳහා එකතුව රු.29,394,416 ක වටිනාකමකට පරිගණක යන්ත්‍ර ,UPS යන්ත්‍ර හා පරිගණක මුද්‍රණ යන්ත්‍ර 200 ක් බැගින් මිල දී ගෙන තිබු අතර, අධ්‍යාපන විෂය වෙනම අමාත්‍යාංශයක් වශයෙන් වෙන් වූ පසුව, මෙම උපකරණ වලින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත භාර දී තිබුනේ යන්ත්‍ර 100 බැගිනි.ඒ අනුව රඳවාගත් යන්ත්‍රවලින් එකතුවරු.11,873,288 ක් වු පරිගණක යන්ත්‍ර 79 ක්, UPS79 ක් හා මුද්‍රණ යන්ත්‍ර 85 ක් 2013 සැප්තැම්බර් 25 දින වන විටත්පාසල් වෙත බෙදා හැරීමකින් තොරව නිෂ්කාර්යව පැවති බවට නිරීක්ෂණය කෙරේ.

(ද) කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක ආපදාවන්ට ලක් වූ 62 දෙනෙකුට ගෙවීම් කිරීමට අවශ්‍ය වූ රු. 565,500 ක් සඳහා සමාජ සුභසාධන, පරිවාස, ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර තිබුණද, 2014 පෙබරවාරි 03 දින දක්වා එම මුදල් ලබාදී නොතිබුණි.

(ම) ගොඩකවෙල රෝහල් භූමියෙහි ඉහල කොටස සඳහා ස්ථිර ආරක්ෂිත වැටක් නොතිබුණු අතර,රෝහල්භූමියෙන් කොටසක් මායිමේ පදිංචිකරුවන් විසින් අනවසරයෙන් අත්කර ගෙන ඇති බව නිරීක්ෂණය විය.රෝහල් භූමියේ ඉහල කොටසට මායිම්ව ඇති පෞද්ගලික නිවසකට පිවිසීම සඳහා රෝහල් භූමිය හරහා මාර්ගයක් සකසා තිබූ අතර, එම ස්ථානයෙහි ආරක්ෂිත වැටෙහි කම්බි කපා මාර්ගය සකස් කරගෙන තිබුණි.

(ප) 2007 අංක 11 දරන මදුරුවන් බෝවීම වැලැක්වීමේ පනත මගින් මහජන සෞඛ්‍ය පරීක්ෂක නිළධාරීන්ට ලබා දී ඇති මදුරුවන් බෝවන ස්ථාන පවත්වාගෙන යන ආයතන හා පුද්ගලයින්ට එරෙහිව සෘජුව නඩු පැවරීමේ බලය යටතේ 2012 පළමු කාර්තුවේ දී නඩු 55 ක් පවරමින් රු.196,000 ක දඩ මුදල් අයකර තිබුණ ද, 2012 අප්‍රේල් සිට විගණිත දිනය වු 2013 ඔක්තෝබර් 30 දක්වා උක්ත පනත යටතේ ඇඹිලිපිටිය සෞඛ්‍ය වෛද්‍ය නිළධාරීකාර්යාලය විසින්කිසිදු නඩුවක් පවරා නොතිබුණි. තවද, 2012 වර්ෂයේ දී ඩෙංගු රෝගීන් 248 ක් ද 2013 සැප්තැම්බර් අවසන් වන විට ඩෙංගු රෝගීන් 154 ක් ද වාර්තා වී තිබුණි.

(බ) සෞඛ්‍ය පෝෂණ හා ආරක්ෂණ අමාත්‍යාංශය මගින් ඖෂධවල තත්ත්වය අසමත්වීම හේතුවෙන් ඖෂධ තොග භාවිතයෙන් ඉවත් කිරීමට ලිපි මගින් දැනුම්දීම සිදුකෙරුණද,එකී දැනුම්දීම රෝහල් වලට ලැබීමට ප්‍රමාදවීම හේතුවෙන් සබරගමුව පළාතේ රෝහල් 03 ක තත්ත්වයෙන් අසමත්

ඖෂධ භාවිතාකර අවසන්වී තිබීම සහ විශාල වශයෙන් රෝගීන්ට නිකුත්කර තිබීම නිරීක්ෂණය විය.

(ය) සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පශු වෛද්‍ය නිළධාරී කාර්යාල වල අධීක්ෂණය යටතේ කිරි අලෙවිසැල් නඟා සිටුවීම සඳහා එකී අයතන 05 ක් වෙත වර්ෂ කිහිපයක් තුල ලබා දී තිබු එකතුව රු. 67,639,425 ක් වටිනාකමැති ශීතකරණ සහ අධිශීතකරණ ඇතුළු උපකරණ 13 ක් 2013 වර්ෂය වන විට මාස 05 සිට වර්ෂ 04 දක්වා වු කාලයක් නිශ්කාර්යව පවතින බවට අනාවරණය වුයෙන් කිරි අලෙවි සැල් සඳහා භාණ්ඩ ලබා දීමේ ක්‍රියාවලියෙහි පසු විපරම් කටයුතු වල දුර්වලතාවයන් විගණනය විසින් නිරීක්ෂණය කෙරේ.

## 6.4 පළාත් මාර්ග සංවර්ධනය හා වැඩිදියුණු කිරීම

පළාත් මාර්ග සංවර්ධනය, ග්‍රාමීය යටිතල පහසුකම්, සංචාරක සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ සමාලෝචිත වර්ෂයේදී ඉදිකර තිබූ පළාත් මාර්ග 09 ක් සම්බන්ධයෙන් සිදුකරන ලද නියැදි විගණන ක්ෂේත්‍ර පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| කර්මාන්තයේ නම | 2013.12.31 ට වියදම රු. | පරික්ෂණදිනය | නිරීක්ෂණය වු අඩුපාඩු |
|---|---|---|---|
| පොතුපිටිය ඉළුඹකන්ද මාර්ගය නවීකරණය කිරීම | 1,165,483 | 2013.11.12 | මාර්ග තලය සමස්ථ ප්‍රමාණයෙන් සියයට 80ක් කඩතොලු වී වලවල් සෑදීම. |
| සිදුරුපිටිය කොළඹගම මාර්ගයේ පැති බැම්මක් ඉදි කිරීම. | 153,011 | 2013.11.13 | පැති බැම්මට ඇතුළතින් ගල් ඇතිරිය යුතු වුවද එසේ නොකිරීම. |
| අටල්ල ගමේකන්ද මාර්ගය සංවර්ධනය කිරීම. | 2,700,521 | 2013.11.12 | තාර කොටස් ගැලවී ගල් මතුවී තිබීම. |
| මොරතොට අමුවත්ත මාර්ගය නඩත්තු කිරීම | 891,213 | 2013.11.05 | දෙවනවර තාර ආලේපය සේදීයාම, මාර්ගය කැඩීම. |
| දෙමුවාත දිගන්දල මාර්ගය නඩත්තු කිරීම | 2,009,428 | 2014.02.11 | දෙවනවර තාර ආලේපය ගැලවී තිබීම. |
| තෝරගල සිට කච්චිගල මාර්ගය ඉදි කිරීම | 932,358 | 2013.08.23 | මාර්ගය නිසිලෙස නොතැලීම හේතුවෙන් මාර්ග තලයේ ස්ථාන කීපයක බැසීම් ඇතිවී තිබීම. |
| කොටුවේගෙදර මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 370,000 | 2013.08.25 | මාර්ගය පුරාවටම මතුපිට පෘෂ්ඨයේ දැඩිලෙස අගල් 3/4 ගල් මතුවී තිබීම. |
| තෝරගල මෙත්ගත්වෙල 03 ඇලපාර ඉදිකිරීම | 651,032 | 2013.08.23 | නිසිලෙස තැලීම සිදු නොකිරීම හේතුවෙන් මීටර් 500 ස්ථානයේ වර්ග මීටර 1.5 ක වලක්ද මීටර් 400 ස්ථානයේ මීටර් 20 ක් දුරට තදබල ලෙස වලවල් ඇතිවී තිබීම. |

| | | | |
|---|---|---|---|
| මුවගම බලිබත්ගොඩ මාර්ගය වැඩිදියුණු කිරීම. | 2,485,809 | 2013.03.08 | මාර්ගයෙහි මතුපිට පෘෂ්ඨයෙහි කැඩී ඉරිතලා පැවතීම. |

6.5 <u>දෘශ්‍ය අක්‍රමිකතා</u>

ඇඹිලිපිටිය හා බලංගොඩ අධ්‍යාපන කලාපයේ පාසල් 02ක් විසින් 2012 හා 2013 වර්ෂයන්හි දී එකතුව රු.144,552ක වංචනික ස්වරූපයේ ගනුදෙනු වලට එළඹ තිබුණි.

6.6 <u>අරමුදල් ඌන උපයෝජනය</u>

2002 දෙසැම්බර් 04 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක HRD/PPM/2002/30දරන චක්‍රලේඛය මගින් බලාත්මක කරන ලද අධ්‍යාපන ගුණාත්මක යෙදවුම් මිලයට ගැනීම සහ බෙදා හැරීම පිළිබඳ මාර්ගෝපදේශ අත් පොතෙහි ඡේද අංක 21.1 ප්‍රකාරව, පාසල් ප්‍රධානීන් විසින් අනුමත ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් ගුණාත්මක යෙදවුම් සඳහා වූ මුදල්, වර්ෂය තුළ දී වියදම් කළ යුතු වුවද,රත්නපුර දිස්ත්‍රික්කයේ කලාප අධ්‍යාපන කාර්යාල 04කට අදාලපාසල් 372ක සමාලෝචිත වර්ෂය සහ පෙර වර්ෂයන්හි දි ලැබුණු මුදලින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට එකතුව රු. 37,655,096ක් වියදම් නොකර බැංකු ගිණුම්වල නිෂ්කාර්යව පැවතුණි.

6.7 <u>නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්</u>

පළාත් සභාවට අයත් විවිධ ආයතනයන්හි පහත විග්‍රහ කර ඇති පරිදි භෞතික සම්පත් නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණනපරීක්ෂණ වල දී නිරීක්ෂණය විය.

| | වත්කම් ස්වභාවය | සංඛ්‍යාව | වටිනාකම රු. | නිෂ්ක්‍රීයව පැවති කාලය |
|---|---|---|---|---|
| (අ) | ඉඩම් | 19 | ඉදිරිපත් නොවුණි | අවු. 01 –අවු.08 |
| (ආ) | ගොඩනැගිලි | 29 | 76,207,544 | මාස 09 - අවු. 08 |
| (ඇ) | වාහන | 23 | ඉදිරිපත් නොවුණි | අවු.05 |
| (ඈ) | යන්ත්‍රෝපකරණ | 24 | 1,146,198 | අවු. 13 |
| (ඉ) | වෛද්‍ය උපකරණ | 38 | 4,675,143 | මාස 03 - අවු.52 |
| (ඊ) | කාර්යාල උපකරණ | 594 | 13,666,687 | මාස 08 - අවු.09 |
| (උ) | වෙනත් | 1479 | 695,155 | අවු.01 - අවු.09 |

6.8 <u>හඳුනා ගන්නාලද පාඩු</u>

මාවනැල්ල අධ්‍යාපන කලාපය සහ කෑගල්ලඅධ්‍යාපන කලාපයට අදාල පාසල් 04 ක පුස්තකාල පොත් 1336 ක ඌනතාවයක් සහ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ වර්ග 125 ක ඌනතාවයක් අනාවරණය කරගෙන තිබුණද,සබරගමුව පළාතේ පළාත් සභාවේ මුල්‍ය රීති 55.1.3 ප්‍රකාරවඌනතාවය අයකර ගැනීමටපියවර ගෙන නොතිබුණි.

6.9 <u>කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශ 02 ක් විසින් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මකකර තිබූ ඉදිකිරීම් 04 කටඅදාළව සම්මත රේටයන් නිවැරදිව යොදා නොගැනීම, සත්‍ය මිනුම් නිවැරදිව ලබා නොගැනීම වැනි හේතූන් නිසා එකතුවරු. 262,435 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) බලංගොඩ කළාප අධ්‍යාපන කාර්යාලය විසින් පාසලක කරණු ලැබූ ඉදිකිරීමක් සම්බන්ධයෙන් රු. 100,922 ක ප්‍රමාද ගාස්තු අයවිය යුතුව පැවතුණි.

(ඇ) 2007අප්‍රේල් 12 දිනැති 2007 අංක 14 දරණ එකතුකල අගය මත බදු (සංශෝධන) පනතෙහි 07 වගන්තිය ප්‍රකාරව 2008 වර්ෂයේ සිට එකතු කළ අගය මත බදු වලින් 1/3ක් රඳවාගෙන දේශීය අදායම් කොමසාරිස්වරයාට සෘජුව ප්‍රේෂණය කල යුතු වුවත් පළාත් මාර්ග සංවර්ධනය, ග්‍රාමීය යටිතල පහසුකම්, සංචාරක සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් රු.120,703ක් වූ එකතුකළ අගය මත බදු වලින් 1/3ක කොටස රඳවා නොතබා කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවා තිබුණු අතර එකතු කල අගයමත බදු පනතේ බදු ඉන්වොයිසියක තිබිය යුතු තොරතුරු දක්වා තිබියදී කොන්ත්‍රාත්කාර ආයතන 14ක් ඉදිරිපත් කර තිබූ අසම්පූර්ණ හා බැලුබැල්මට ව්‍යාජ ඉන්වොයිසිපත් බව වටහාගත හැකිව තිබූ, වැට් ඉන්වොයිසිපත් 446කට වවුචර් වටිනාකම රු.478,037,742ක මුදලක් ගෙවා තිබුණි.

(ඈ) කහවත්ත මූලික රෝහලේ විශේෂඥ වෛද්‍ය නිළධාරී නිල නිවස අලුත්වැඩියාව II අදියර කර්මාන්තයරු.4,585,261 කට එකඟ වූ වැඩ වටිනාකමකට අලුත්වැඩියා කර තිබූ අතරබිත්ති ඇතුළත කපරාරුව සඳහා එකතුව රු.304,818 ක මුදලක් ගෙවා තිබුණ ද, ඇතුළත කපරාරුව එකතුව දිග මීටර් 12 කපමණ ස්ථාන කිහිපයකම ඉරිතලා ගොස් තිබූ බව 2013 සැප්තැම්බර් 18 වන දින සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී අනාවරණය විය.

(ඉ) පළාත් මාර්ග සංවර්ධනය, ග්‍රාමීය යටිතල පහසුකම්, සංචාරක සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ පදලංගල ජල ව්‍යාපෘතිය ඉදිකිරීමේ කර්මාන්තය සඳහා එම ව්‍යාපෘතිය සඳහා භාවිතා කළ හැකි මීට ඉහත දී ඉදිකර තිබූ ළිං දෙකක් සහ 2011 වර්ෂයේ දී මෙම ජල ව්‍යාපෘතිය වෙනුවෙන්ම ඉදිකර තිබූ මෝටර් කාමරයක් තිබිය දී, ඒ පිළිබඳව නිසි අවධානයකින් තොරවරු. 141,542ක් වැයකර නව ළිඳක් හා රු. 167,720ක් වැයකර නව මෝටර් කාමරයක් ද ඉදිකර තිබුණි.

6.10 <u>ප්‍රමාද වූ ව්‍යාපෘති</u>

අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු 04ක් විසින් ක්‍රියාත්මක කරනු ලබනඉදිකිරීම් කොන්ත්‍රාත් 10 ක් විවිධ හේතූන් නිසා ප්‍රමාදවීම් නිරීක්ෂණය විය.

## 6.11 කාර්ය මණ්ඩල පරිපාලනය

### 6.11.1 අධ්‍යාපන ක්ෂේත්‍රයේ කාර්ය මණ්ඩල අතිරික්තතා හා ඌනතා

2013 දෙසැම්බර් 31 දිනට සබරගමුව පළාත් සභාවේ එක් එක් කලාප කාර්යාලයන්ට අයත් පාසල්වල විදුහල්පතිවරුන් සහ ගුරු හවතුන්ගේ අතිරික්තයන් හා ඌණතාවයන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | රත්නපුර කළාපය | | බලන්ගොඩ කළාපය | | ඇඹිලිපිටිය කළාපය | | නිවිතිගල කළාපය | | කෑගල්ල කළාපය | | මාවනැල්ල කළාපය | | දෙහිඕවිට කළාපය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අති: | ඌණතා | අති: | ඌණතා | අති: | ඌණතා | අති: | ඌණතා | අති: | ඌණතා | අති: | ඌණතා | අති: | ඌණතා |
| විදුහල්පති | | - | 84 | - | 47 | - | 43 | - | 82 | - | 93 | - | 66 | - | 62 |
| ගුරුහවතුන් | 1.ප්‍රාථමික | - | 68 | - | 87 | - | 175 | - | 181 | - | 95 | - | 119 | - | 175 |
| | 2.ද්විතියික | - | 144 | - | 325 | - | 365 | - | 294 | 100 | 236 | 493 | 60 | - | 364 |

මේ සම්බන්ධයෙන් පහත කරුණු වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(අ) සබරගමුව පළාත් ගුරු සේවයේ හා විදුහල්පති සේවයේ ස්ථාන මාරු වීම් ක්‍රියා පටිපාටියේ 3.7.1 වගන්තිය ප්‍රකාර ඉතා ප්‍රිය මනාප පාසල්වල වසර 06 ක් හෝ ප්‍රිය මනාප පාසල්වල වසර 08 ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද ගුරුහවතුන් / විදුහල්පතිවරුන් විසින් ඉල්ලීමක් නොකළ ද සේවා අවශ්‍යතාවය මත අනිවාර්යෙන්ම ස්ථාන මාරු ලැබීමට යටත් විය යුතු වුවත්, ඊට පටහැනිව කළාප අධ්‍යාපන කාර්යාල දෙකක පාසල් 211 කට අදාලව නියමිත කාල සීමාව ඉක්ම වූ ගුරු හවතුන් 1204 ක් ද පාසල් 61 ක විදුහල්පතිවරුන් හා නියෝජ්‍ය විදුහල්පතිවරුන් 62 ක් ද සිටින බව නිරීක්ෂණය විය.

(ආ) රත්නපුර දිස්ත්‍රික්කයේ කළාප අධ්‍යාපන කාර්යාල 03 ට අදාළ පාසල් 03 ක 2013 වසර අවසන්වන විට ද්විතීයික ශ්‍රේණිවලට අදාළව ආවරණය නොකළ ඌණ කාලපරිච්ඡේද 1736 ක් පැවතුණි. මේ හේතුවෙන්, කලාප අධ්‍යාපන කාර්යාල 02 ට අයත් පාසල් 06 ක 2012 වර්ෂයේ අපොස (සා.පෙළ) විභාගයේ විෂයයන් 09 කට අදාළව අසමත්වීමේ ප්‍රතිශතය සියයට 33 සිට සියයට 100 දක්වා වූ ඉහල පරාසයක පැවතුණි.

(ඇ) 2003 නොවැම්බර් 07 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 2003/38 ප්‍රකාරව විෂයය ඉගැන්වීමේ නියුක්ත ගුරුහවතුන් සතියකට සාමාන්‍යයෙන් විනාඩි 40 ක කාලපරිච්ඡේද 35 ක්ද, විෂයය ඉගැන්වීමට අමතරව පන්තිභාරව සිටින ගුරු හවතුන් සතියකට එම කාලපරිච්ඡේද 33 ක්ද, උසස්පෙළ ගුරු හවතුන් සතියකට කාලපිරිච්ඡේද 30 ක්ද, ඉගැන්වීමෙහිකටයුතුවල නිරතවියයුතු වුවත්, ඇඹිලපිටිය කළාපයේ පාසල් 02 ක් විසින් ඊට පටහැනිව කාලපරිච්ඡේද වෙන් කිරීම නිසා 2013 වර්ෂයේදී ගුරු හවතුන් 36 දෙනෙකු විසින් කාලපරිච්ඡේද 9530 ක් එනම් පැය 6353 ක් අධ්‍යාපන කටයුතුවලින් පරිබාහිරව නිෂ්කාර්යව සිට ඇති බව නිරීක්ෂණය විය.

(ඈ) ඇඹිලිපිටිය කලාපය තුල ගුරු පත්වීම් වර්ග අනුව ගුරුවරු 452 කඅතිරික්තයක්ද, ගුරුවරු 468කඌනතාවයක් ද පැවති අතර, 468 ගේ ඌනතාවය අතිරික්ත ගුරු සංඛ්‍යාවෙන් ආවරණය කර ගැනීමට හැකියාව තිබියදී ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඉ) ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපයේපාසල් 07 ක උපාධි සමත් ගුරු භවතුන් 12ක් හා පාසල් 03ක ගුරු සේවයේ ගුරු භවතුන් 07ක් කිසිදු විෂයකට අනුයුක්ත කර නොතිබුණු අතර, කෑගල්ල අධ්‍යාපන කළාපයේ පාසලක කිසිදුරාජකාරියක් ඉටුනොකරන ලදගුරු භවතුන් තිදෙනෙකු වෙත2009 වර්ෂයේ සිට 2013 සැප්තැම්බර් වනවිටරු. 2,387,901 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

(ඊ) බලංගොඩ අධ්‍යාපන කලාපයේ පාසලක පන්ති 14 ක විශයයන් 06 ක් සඳහා ගුරුභවතුන් අනුයුක්ත කිරීමේ දී , ගුරුභවතුන්18 දෙනෙකුට එකම පන්තියේ එකම විශයය ඉගැන්වීම සඳහා සතියකට කාලච්ඡේද 106 ක් වෙන් කර දී තිබුණි.

6.11.2 **සෞඛ්‍ය ක්ෂේත්‍රයේ කාර්ය මණ්ඩල අතිරික්තතා හා ඌනතා**

සෞඛ්‍ය ක්ෂේත්‍රයේ එක් එක් සේවාවල සේවක අතිරික්තය හෝ ඌනතාවය, විවිධ ආයතන මට්ටමින් පහත දැක්වේ.

| | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | | රත්නපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයසහ රත්නපුර දිස්ත්‍රික්කයේ පළාත් රෝහල් | | කෑගල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සහ කෑගල්ල දිස්ත්‍රික්කයේ පළාත් රෝහල් | | ඇඹිලිපිටිය මූලික රෝහල් | |
|---|---|---|---|---|---|---|---|---|
| | අතිරික්තය | ඌනතාවය | අතිරික්තය | ඌනතාවය | අතිරික්තය | ඌනතාවය | අතිරික්තය | ඌනතාවය |
| වෛද්‍ය | - | 5 | 5 | 15 | 20 | 35 | 4 | 9 |
| හෙද | - | 1 | - | 66 | - | 21 | - | 36 |
| ඖෂධවේදී | - | - | - | 3 | - | 8 | - | 15 |
| මහජන සෞඛ්‍යපරීක්ෂක | - | - | - | 7 | - | 1 | - | - |
| පවුල් සෞඛ්‍ය | | | | - | | | | |
| සේවක | - | - | - | 69 | - | 44 | - | 5 |
| තාක්ෂණික | - | - | - | 51 | - | 17 | - | - |
| උපස්ථායක | - | - | - | 96 | - | 51 | - | 34 |
| කම්කරු | - | - | - | 27 | - | 8 | 1 | - |
| එකතුව | - | 06 | 05 | 334 | 20 | 185 | 05 | 99 |

මේ සම්බන්ධයෙන් පහත කරුණු වැඩිදුරටත් නිරීක්ෂණය විය.

කෑගල්ල දිස්ත්‍රික්කයේරෝහල් 02කකාර්ය මණ්ඩලයේ 109 දෙනෙකුගේ ඌනතාවයක් පැවතුණු අතර,තවත්රෝහලක හෙද, ඖෂධ සංයෝජක, ඖෂධවේදී යන තනතුරු සඳහා නිලධාරීන් අනුයුක්ත කර නොතිබුණු බැවින් අදාළ කාර්යයන් උපස්ථායිකාවන් විසින් සිදු කරනු ලබන බව නිරීක්ෂණය විය.

6.12 බැංකු සැසඳුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාස 06ක කාලයක් ඉක්මවා නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ එකතුව රු. 3,746,992ක් වූ චෙක්පත් 459ක් සම්බන්ධයෙන් සබරගමුව පළාත් මූල්‍ය රීති 283.4 ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතරමාස 06ක කාලයක් ඉක්මවා උපලබ්ධි නොවූ එකතුව රු. 2,458,053 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු කර නොතිබුණි.

(ආ) බැංකු ගිණුම් 15 කට අදාළ හඳුනා නොගත් හර කිරීම්වල එකතුව රු. 1,258,985ක් වූ අතර, බැංකු ගිණුම් 15 කට අදාළව හඳුනා නොගත් බැර කිරීම්වල එකතුව රු. 5,477,631 ක් විය.

6.13 අවිධිමත්ගණුදෙනු

අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ ආයතන 05ක් විසින් සමාලෝචිත වර්ෂයේ දී එකතුව රු. 1,914,355ක් වටිනාකමැති අවිධිමත් ස්වරූපයේ ගණුදෙනු 05කට එළඹ තිබුණි.

6.14 ප්‍රමාණවත්ලෙස ඉටුනොවුණුඅරමුණු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් සියයට 50 සහනාධාර යටතේ රු.120,000ක් වැයකර කලවාන කෘෂිකර්ම උපදේශක කාර්යාලයේ අධීක්ෂණය යටතේ තරුණ ගොවි සංවිධානයේ සාමාජිකයෙකු වෙත 2012 දෙසැම්බර් 28 දින ලබාදී තිබූ ලීටර් 13 පීඩන උඳුන විගණිත දිනය වූ 2013 දෙසැම්බර් 06 දින වන විට ලබාදී මාස 11ක් ගතව තිබුණද ප්‍රයෝජනයට නොගෙන තිබීමෙන් සහනාධාරය ලබාදීමේ අරමුණ ඉටුවී නොතිබුණි.

(ආ) තොටපල්ල මැටි ගම්මානය පොදු සේවා මධ්‍යස්ථානයක් ලෙස අලුත්වැඩියා කිරීම වෙනුවෙන් රු.1,829,725ක් වැයකර පොදු පහසුකම් සපයා දී තිබුණද, අඛණ්ඩ අධීක්ෂණයක් හා පසු විපරම් කටයුතු සිදු නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතියෙහි මූලික අරමුණු තුනෙන් දෙකක්ම ඉටු වී නොතිබුණි. මෙම ව්‍යාපෘතියේ ඍජු ප්‍රතිලාභීන් ලෙස විසි දෙනෙකු හඳුනාගෙන තිබුණද, සක්‍රීය ලෙස දායක වී තිබුණේ ප්‍රතිලාභී පවුල් 05 ක් පමණි. තවද 2013 දෙසැම්බර් 31 දින වන විටත් ව්‍යාපෘතියෙහි ප්‍රගති පාලන හා පසු විපරම් කමිටුව පත් කිරීමට හෝ පියවර ගෙන නොතිබුණි.

07. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

7.1 ක්‍රියාකාරී සැලැස්ම

ආයතන 09 ක් විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කර නොතිබුණු අතර, ඉඩම්, පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශයේවාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව 2013 ජූලි 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 75 මට්ටම දක්වා සම්පූර්ණව තිබිය යුතු ව්‍යාපෘති 239 කින් එදින වන විට ව්‍යාපෘති 201ක වැඩ ආරම්භ කර හෝ නොතිබුණි.

7.2 විගණනහාකළමනාකරණකමිටු

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු 23 ක් සඳහා එක් විගණන හා කළමනාකරණ කමිටුවක් බැගින් ද දෙපාර්තමේන්තු 02 ක් සඳහා විගණන හා කළමනාකරණ කමිටු 02 බැගින් ද පවත්වා තිබූ අතර අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු 03 ක් සම්බන්ධයෙන් එකදු කමිටුවක් හෝ පවත්වා නොතිබුණි.

7.3 ප්‍රසම්පාදන සැලැස්ම

ආයතන 11 ක්විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණු අතර ඉඩම්, පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයට අදාළ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමේදී 2006 මාර්තු 24 දිනැති අංක 128 දරණ ජාතික අයවැය චක්‍රලේඛය මඟින් සලසා ඇති විධිවිධාන කෙරෙහි අවධානය යොමු නොකර අදාල

ආකෘතීන්ගෙන් බැහැරව සකස්කර තිබුණු අතර, රජයේ මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඉ) ප්‍රකාරව මාස 6කට වැඩි නොවන කාලයක් තුළදී නිතිපතා යාවත්කාලීන කර නොතිබුණි.

7.4 <u>අයවැය ලේඛනමය පාලනය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආදායම් සංකේත 13කට අදාලව සමාලෝචිත වර්ෂයේ ආදායම ඇස්තමේන්තු කිරීමේදී, 2012 වර්ෂයේ තත්‍ය ආදායම කෙරෙහි නිසි සැලකිල්ලක් නොදක්වා එකතුව රු. 338,159,267ක් අඩුවෙන් ආදායම ඇස්තමේන්තු කර තිබුණි. තවද, එම සියළු ආදායම් සංකේතවල 2012 වර්ෂයේ තත්‍ය ආදායම 2011 වර්ෂයේ තත්‍ය ආදායමට වඩා වැඩි වී තිබුණි.

(ආ) ආදායම් සංකේත 05කට අදාලව 2012 වර්ෂයේ ආදායම රු. 207,371,478 ක් වුවද, 2013 වර්ෂයේ ආදායම රු. 164,743,536 ක් වීමෙන් රු. 42,627,942 ක් ආදායමේ අඩුවීමක් නිරීක්ෂණය වූ අතර, ඒ සඳහා හේතු වූ කරුණු විශ්ලේෂණය කර එම ආදායම් වැඩිකර ගැනීමට අවශ්‍ය පියවර ගැනීම පිළිබඳව අවධානය යොමුකර නොතිබුණි.

7.5 <u>නොවිසඳීඇතිවිගණනඡේදපිළිබඳනිරීක්ෂණ</u>

පළාත් ගිණුම් කාරක සභාවේ සාකච්ඡා කරන ලද 2001 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා වූ වර්ෂ 05 ට අදාළ විගණකාධිපති වාර්තාවන් හි ඇතුළත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු 06 කට අදාළ විගණන ඡේද 123 ක් සම්බන්ධයෙන් අදාළ නිවැරදි කිරීමේ කටයුතු සිදුකර නොතිබුණි.

08. <u>පද්ධති හා පාලනය</u>

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර සබරගමුව පළාත් සභාවේ ආයතන ප්‍රධානීන් හා ප්‍රධාන ලේකම්වරයා දැනුවත් කරන ලදි. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය හා මූල්‍ය පාලනය.

(ආ) වත්කම් හා මානව සම්පත් පාලනය.

(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය.

(ඈ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

(ඉ) පාසල් කළමනාකරණය.

(ඊ) රෝහල් කළමනාකරණය.